# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 (II) 2025

අංක 2,468 හා 2025.10.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද "සංවර්ධන නිලධාරි සේවයේ I වන, II වන හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 (II)" විභාග නිවේදනයේ 5.0 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

5.0 මෙම විභාගය සඳහා අයදුම් කිරීම මාර්ගගත (online) ක්‍රමවේදය ඔස්සේ සිදු කළ යුතු ය. ඒ සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙත පිවිස "Apply for Examinations" දිගුව භාවිතයෙන් නවක අයදුම්කරුවන්ට අදාළ විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැකිය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2026 සැප්තැම්බර් මස 04 වන දින දක්වා දීර්ඝ කරනු ලබන අතර විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම 2026.08.15 දින පෙ.ව. 8.00 සිට 2026.09.04 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක. මෙම විභාගය 2026 නොවැම්බර් මස දී පැවැත්වීමට කටයුතු කෙරේ.**

තවද, මින් පෙර මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන්ට සෘජුව https://examinationportal.slida.lk/app/applied-exams දිගුව ඔස්සේ පද්ධතිය වෙත පිවිස, තමන් විසින් සකස් කරගත් පරිශීලක ගිණුම (User Account) භාවිත කර ඉදිරිපත් කරන ලද අයදුම්පතේ තත්ත්වය (Application Status) පිළිබඳව තොරතුරු ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

එහි දී අයදුම්පතෙහි තත්ත්වය පහත පරිදි අර්ථ දැක්වේ :

I. Approved - අයදුම්පත අනුමත කර ඇති බැවින් තවදුරටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය නොවේ.

II. Draft - අයදුම්පතෙහි පවතින අඩුපාඩු හෝ අසම්පූර්ණ තොරතුරු සංශෝධනය කර නැවත ඉදිරිපත් (Submit) කළ යුතු ය.

III. Reject - අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇති අතර, පද්ධතියෙහි සඳහන් හේතු අනුව,

(*a*.) මුදල් ගෙවීම් සම්බන්ධ ගැටළු - නිවැරදි ගෙවීම් පිළිබඳ තහවුරුවක් (ගෙවීම් ලදු පතෙහි ඡායාරූපක්) doeb2025@slida.gov.lk වෙත විෂයය (Subject) ලෙස නම හා පත්වීම් අංකය (උදා - ඒ. බී. සී. ඩී. පෙරේරා - CS/DOS/00001) සඳහන් කොට ඊ-මේල් පණිවුඩයක් මගින් ඉදිරිපත් කිරීම.

(*b*.) වැරදි විභාගය තෝරා ඉදිරිපත් කරන ලද අයදුම්පත් - නැවත නිවැරදි විභාගය තෝරා නව අයදුම්පතක් පෙර මුදල් ගෙවූ කුවිතාන්සිය සමග ඉදිරිපත් කළ යුතු ය. (උදා - සංවර්ධන නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ද, සංවර්ධන නිලධාරි සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් II කාර්යක්ෂමතා කඩඉම් විභාගය ද, සංවර්ධන නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය)

(*c*.) උසස්වීම් සම්බන්ධ ගැටළු - අදාළ උසස්වීම් නොලද නිලධාරීන් රා.සේ.කො. චක්‍රලේඛ අංක 02/2023 යටතේ ඉල්ලුම් කළ නොහැක.

මෙම නව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ දී සිදුවන තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-4513368 හා 011-4513366 යන දුරකතන අංක ඔස්සේ විමසීම් සිදු කළ හැක.
මීට අමතරව විභාගය සම්බන්ධ අනෙකුත් ගැටලු සම්බන්ධයෙන් පහත දුරකතන අංකවලට අමතා ඔබගේ ගැටළු ඉදිරිපත් කරන්න.

පත්වීම් අංක CS/DOS/00001 - CS/DOS/52500 හා CS/DOS/A/90000 ට වැඩි : 011-2673560
(2020.01.01 දින හා ඊට පසු බඳවාගත් සංවර්ධන නිලධාරීන්)
පත්වීම් අංක CS/DOS/52501 - CS/DOS/A/90000 : 011-2684223
(2020.01.01 දින හා ඊට පසු බඳවාගත් සංවර්ධන නිලධාරීන්)

02. අංක 2,458 හා 2025.10.10 දිනැති *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන නොවෙනස්ව බලපැවැත්වෙන අතර අයදුම්පතේ තත්ත්වය (Application Status) Approved නිලධාරීන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය නොවන බව නිවේදනය කරනු ලැබේ.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,

2026, ජූලි මස 31 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 104